




සිසිර දිසානායක

# විජය - කුවේණි



"හිල් නොවච්ච මේස් කුට්ටමක් හොයාගන්න තියෙන අමාරුවක් !" පන්හිඳ තමුන්ගෙ ඇඳුම් ගොඩ පෙරළුවා......

කමිසෙනම් පිට පළුව නැතත් ඇන්දැකි, ජර්සි එකක් උඩින් අඳින හන්ද.

ඒත් ඉතින් තැනකට ගියාම සපත්තු ගලවන්න ඕන හන්ද මේස් දෙක හරියට තියෙන්න ඕන...." පින්සල තමුන්ගෙ කමිසය මැද්ද.

"අද ඉතින් යන්න තියෙන්නෙ සපත්තු ගලවන්න ඕන තැනකට නෙවෙයිනේ......?" පැන්සල තමුන්ගෙ සපත්තු දෙක පොලිෂ් කරන ගමන් කිව්වා......

"ඇත්තට ම මේ වගේ තැන්වලට තමා අපි සපත්තු ගලවලා ඇතුල්වෙන්න ඕන......" පන් ට යන්තම් හොඳ මේස් කුට්ටමක් හම්බ වෙලා.

"අපිට නොපුරුදු පරිසරයක අපිට ඇඳුමේ පැළඳුමේ ඉඳන් හිතන්න වෙලා. ඒ විදියට පුරුදුවෙන්න වෙලා. ඒ වගේ පරිසරයක හැදෙන අපේ ළමයින්ට අපේ විදියට හැමදෙයක්ම හිතන්න, අගය කරන්න, අපේ දේවල් පුරුදු කරන්න දඟලන එක ලේසි පහසු දෙයක් නොවේ. ඒ වාගේ තැන්වලට, ඒ අයගේ දේවල් ඉදිරිපත් කරන තැන්වලට ඇතුල් වෙනකොට සපත්තු ගලවලා ඇතුල්වෙන එක ඇත්තටම වටිනවා. අපේ දරුවන් වෙනුවෙන් කෙරෙන එක විදියක පින්කමක් ඒ අයට අපේ හොඳ දේවල් දෙන එක. ඒ නිසා ඒ වාගේ තැන් හරියට පුණ්‍යස්ථාන වගේ කියලයි මට නම් හිතෙන්නෙ." පන්ගේ දිග විස්තරය ඉවර වෙනකොට තුන්දෙනාම හිටියේ කාර් එකේ. පැන් බෝර්වුඩ්වල බීසන් සෙන්ටර් රංග ශාලාව පැත්තට වාහනේ පැදෙව්වා. කට්ටියම මේ ගියේ විශ්ව රංගායතනය ඉදිරිපත් කරපු "විජය"කුවේණි" නැටුම් ප්‍රසංගය බලන්න. "විශ්ව නර්ථන රේඛා" කියලා අවුරුදු දෙකකට සැරයක් ඉදිරිපත් කරන නැටුම් ප්‍රසංගය "විජය"කුවේණි" ඉතිහාස කතාවක් පසුබිම් කරගෙනයි මේ වාරේ ඉදිරිපත් කරන්න රසිකා කුලසිංහ නැටුම් ගුරුතුමිය සූදානම් වෙලා හිටියේ.

වරුණ සාවින්ද මහත්තැන්ගේ අලුත් වැඩක් විදියට නිර්මාණය වෙලා තිබුණ ටිකට් දෙරටුවේදී පෙන්නුවාට ඒ වගේ ම නිර්මාණාත්මක පිටකවරයකින් වටවුණ සමරුවකුත් අපේ අයට ලැබුණා. පැතුම් තිලකසිරියි ශිවන්ති නානායක්කාරයි නිවේදන කටයුතු කරමින් ප්‍රසංගය ඉදිරිපත් කළා. ප්‍රසංගය පටන් ගත්තාට පස්සේ පන් තමන්ගේ මතක පොතේ සටහන් ලියන්න ගත්තා.


ඡේයා රූ - ප්‍රසන්න කුරුකුලරත්න

"කුවේණියගේ සිහිනය" නම් වු පළමුවන අංගයේදී නර්ථනාචාර්යවරිය පූජා නැටුමකට අවසරය ලබාගන්නීය. කුවේණිය සයනගතව හිඳිද්දී අනෙක් පිරිස පහන් ගෙන රඟනා රංගනය සෘජුවම පූජා නැටුමක් නොවුවද නිර්මාණාත්මකව ඒ හැඟීම ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කරන්නීය. උඩරට නර්ථනයේ භාවිතා වන ඇඳුම් ආයිත්තම්වලට සමගාමීව මෙම ඇඳුම් කළු"සුදු වර්ණ මුල්කොට ගෙන නිර්මාණය වී තිබිණ.

ඉන් පසුව ඉදිරිපත් වන අංග දෙක වෙන්වන්නේ එකල ලංකාවේ විසු යක්ෂ හා නාග ගෝත්‍රිකයින් සිහිපත් කරමින් නිර්මාණය වු අංග දෙකකටයි. මෙම අංග ඉදිරිපත් කිරීමේදී ඊට අදල පසුතලය පසු තීරයේ ප්‍රදර්ශනය කිරීමට සැළසෙන්නේ නර්ථනයේ අදහස වඩාත් තීව්‍ර කරමිනි. ඉතාම කලාත්මක හා අර්ථාන්විත, ගැලපෙන රූප රාමු ඒ සඳහා යොදගැනීම මෙවර කැපී පෙණුන ලක්ෂණයකි. සුජිත් හා මධුර බණ්ඩාර දෙපළගේ ආලෝකකරණයද මනා සංයමයකින් යුතුව නර්ථනයට, ඇඳුම් වලට, පසුතලයට හා අර්ථයට අනුව යොද ගැණින.

කුවේණිය ඇතුළු ගෝත්‍රිකයින්ගේ පසුබිම හුවා දක්වමින් ඉදිරිපත් කළ නර්ථන "කපු කැටීමේ නර්ථනය" නම් විය. ගෝත්‍රික ඇඳුමින් සැරසීගත් තරුණියන් පිරිස නර්ථනයේ යෙදෙද්දී කුවේණිය කපු කටිමින්ද තවත් විටෙක නර්ථනයට සහභාගී වෙමින්ද සිය කුසලතා මොනවට පෙන්වුවාය. සිය සිසුන් ගෝත්‍රික නර්ථනයට දක්වන දක්ෂතා ඉදිරිපත් කිරීම සඳහා නර්ථනාචාර්යවරිය කදිමට කළ පෙළ ගැන්වුමකි මේ. ප්‍රසංගයේ ඇඳුම් ආයිත්තම් ද ඇයගේම නිර්මාණයන් විය. මේ සඳහා නිර්මාණය කර තිබුණු කපු කැටීමේ යන්ත්‍රය රූපයකට සීමා නොවී ක්‍රියාකරවිය හැකි ලෙස නිමවා තිබුණ අතර, කලාත්මක බව්න්ද අනුනව වේදිකාවේ සංඛේතාත්මක අංගයක් ලෙසින් පසුතලය අර්ථාන්විත කරවීය.

හෙන්රි ජයසෙනයන්ගේ "කවේණි" නාට්‍යයේ මානෙල් ජයසේන ශිල්පිනිය ගයමින් රඟන ලද " සත් සියක්" වේදිකා නාට්‍ය ගීයෙන් ඊළඟ අංගය සැරසිණ. කුවේණිය සතුව තිබු කාන්තා පෞර්ෂය මෙන්ම ලාලිත්‍ය ඉස්මතුවන නර්ථන විලාසයකින් නිර්මාණය වු මෙම අංගයේදී ,වේණිය වෙනුවෙන් පෙනී සිටි දැරියගේ නර්ථනය මතු නොව රංගනය, අභිනය වැනි ලක්ෂණද වඩාත් කපී පෙණින. ඉතා සියුමැලි කාන්තාවකට වඩා පෞර්ෂයය ද කැටි වු ලාලිත්‍යයන්, රූප ලාවණයත් ඇයගේ නර්තනය අර්ථවත් කරවිය.

විජයගේ සම්ප්‍රාප්තිය හඟවමින් පසුතලයෙන් දිස් වු රුවල් නෞකාවද රැළි නංවන සයුරෙහි දර්ශනයද කතාවේ අංග සම්බන්ධ කරමින් ඉදිරියට ගලායන්නට ඉවහල් විණි. මෙරට මතු නොව මව්බිමෙහි පවා පිරිමි දරුවන් නර්ථනය සඳහා ඉදිරිපත් වීම සාපේක්ෂව අඩුයි. එසේ වුවද නර්ථනාචාර්යවරිය එම අභියෝගයද ජයගෙන ඇති බව පසක් වුයේ ඉන් අනතුරුව ඉදිරිපත් වු අංග කීපයේදීයි. විජයාවතරණායත් සමඟින් එකී පිරිස ගොඩබිම විමසීම අසිපත්වල බලය පෙන්වීම වැනි නර්ථනාංග පිරිමි දරුවන්ගේ හපන්කම් එළිදැක්වීමට ඉඩ සලසාගත් අංගයක් විය. ඉන් අනතුරුව එක්වන කුඩා දරුවන් වනගත නොයෙකුත් සතුන් හා පක්ෂීන් ලෙසින් ඉදිරිපත් කළේ නර්ථනය මුහුවුණ රංගනයකි. සුරතල් ඇඳුම් පැළඳුමින් සැරසීගෙන ඊටගැලපෙන ආලෝක ධාරා මධ්‍යයේ වේදිකාව පුරා කෙළිමඬලක් මැවු එම දර්ශන පෙළ ආකර්ශනීය වීය.



කුවේණියගේ පිරිස විජයගේ පිරිස විසින් කොටුකර ගැනීම දක්වන නර්ථන රංගනයේදී ගල්ලෙන් තුල දර්ශනවලින් සැරසී ගත් පසුතල වඩාත් අවස්ථාවට ගැලපී ගියේය.

විජය හා කුවේණියගේ මුල්ම මුණගැසීම හා ප්‍රේමයෙන් බැඳීම දැක්වු ඊළඟ අංගය නර්ථනයට වඩා අභිනය හා රංගනයට නැඹුරු වුවක් වු අතර, විජයගේ චරිතයට පණ පෙවු තරුණයාගේ රංගනය කුවේණියට පණ පෙවු තරුණිය හා ගැලපී ගියේදැයි දෙවරක් සිතන්නට සිදුවිය. විජයගේ චරිතය සඳහා තරුණයෙකු තෝරාගැනීමේදී නර්ථනාචාර්යවරිය මුහුණ පෑ අභියෝග මෙහිදී අපට සිතාගත හැකිවිය. ප්‍රසංගයට සහභාගී වු තරුණයන් පිළිබඳව සිතා බැලීමේදී, ඇතැමෙකු නර්ථනයටද, ඇතැමෙකු රංගනයටද , හපන් පෑ අතර, වැඩි පෞර්ෂයයක් හිමි වු තරුණයා ඒ කිසිවකු නොවීය. මේ සියල්ල සමබරව පානා තරුණියක සොයා ගත්තද, තරුණයෙකු සෙවීම නම් උගහට වන්නට ඇත. කිසිද දරුවකු වඩාගෙන නැති තරුණයෙකුට විජය දරු සුරතල් බලනා ආකාරය ඉගැන්වීම පහසු නොවේ. අපගේ හැදියාවට අනුව ප්‍රේම රංගනයක යෙදී නැති තරුණයෙකු දෙනෝදහක් ඉදිරියේ රගපෑම සඳහා ඊට හුරුකරවීමද පහසු නොවේ. ඇතැම් විට මේ සියල්ල කෙරෙනුයේ ඉංග්‍රීසි බසින් විය හැක. මෙම අංගයේ දී ඉහළින් වේදිකාවට පහත් වන ආදරයේ සලකුණ වන හදවත් ලකුණු තුනක් ඉදිරිපිට බටහිර නර්ථන වින්‍යාසයකින් ප්‍රේමාලිංගන නර්ථනයකට එක්වන පෙම් යුවල තුන වඩාත් සාකච්ඡාවට ලක්විය යුතු කාරණය විය. මෙතෙක් ගලා ආ ඓතිහාසික වෘත්තාන්තය පසුබිම් කරගත් දේශීය නැටුම් ආරයට ඉඳුරාම වෙනස් වු නිසා නොගැලපීමක් ලෙසින් පෙනුණද ඒ නොගැලපීම තුල යම් නිර්මාණාත්මක බවක්ද දැකිය හැකිය. බටහිර නර්ථනයට හපන් දරුවන්ගේ හපන්කම් දක්වන්නට ඉඩක් ලබාගැනීම පිළිබඳව කිසිවක් කිව නොහේ. මේ අවස්ථාව මග හැරුණිනම් ඊට වෙනත් අවස්ථාවක් නොලැබෙන හෙයිනි. කලායතනයකින් ඉදිරිපත් කෙරෙන ප්‍රසංගයක විවිධත්වය, විවිධ කුසලතා පෙන්වීම මෙන්ම සැමට අවස්ථාවක් ලබා දීමද එක් අරමුණකි. මේ සඳහා සිය දරුවන් යවනා දෙමව්පියන්ගේ අභිප්‍රාය ද එය මයි. මෙහිදී දක්ෂ ළමුන් පමණක් තෝරා බේරාගෙන ඒ අංග පමණක් ඉදිරිපත්කිරීම බලාපොරොත්තු විය හැකිද? සැවොම සහභාගී කරගැනීමට පිළිබඳව ද අප සතුටු විය යුතුව ඇත. අප සිටින්නේ නොරටක නිසාවෙනි ඒ. අපේ දේ සඳහා ඉදිරිපත්වන දරුවන් මෙන්ම දෙමව්පියන් ද ඒ සඳහා උනන්දු කළ යුතු නිසාය ඒ. මේ ශිල්ප හදරන දරුවන්ගේ ශිල්ප දැක්මත් විනා, වෘත්තීය ශිල්පීන්ගේ ශිල්ප හරඹයක් නොවන නිසාය ඒ.

විජය හා කුවේණියගේ යුගදිවිය , දරු උපත යනාදී සිද්ධීන් අභිනයෙන්, රංගනයෙන් හා නර්ථනයෙන් දක්වමින් ප්‍රථම භාගය නිමාවෙයි. දෙවන භාගය කුඩා දරුවන්ගේ නැටුම් විලාශයකින් ඇරඹෙන අතර එය "නෙළුම් පොකුණ" ලෙසින් නම් කෙරිණ. හංසයින් ලෙසින් වෙස්ගත් කුඩා දරුවන්ගේ රැඟුම් හා නැටුම් ද සිත්ගනී. යක්ෂ ගෝත්‍රිකාකාර විවාහයක් ලෙසින් ඉදිරිපත් කළ අංගය වඩාත් තීව්‍ර වුයේ රතු ආලෝකකරණයෙන්, ඒ තුලින් මතු කරගත් සේයාවන්ගේ සංකලනයක් නිසාවෙනි. පසුබිම පුරාවට ගිනි දැල් පැතිර යන්නා සේ දර්ශන පෙළගන්වා තිබිණ. ඉන් අනතුරුව සිය නෑයින්ට වු අසාධාරණය පිළිබඳ කම්පිත කුවේණියගේ මනෝභාවයන් හැඟවෙන අංගයක්ද, ඉන්දියාවෙ-

21 වන පිටට

# I met King Wijaya and Kuveni in Melbourne

Don't be surprised, that was in the dancing concert presented by Visherranga Institute led by popular dancing teacher Rasika Kulasinghe with her well trained students. The whole ceremony was based on Prince Wijaya and Kuveni's legend which was extracted from Sinhala Mahawansa, or The Great Chronicle of Sri- Lanka. It is a very challenging task to recreate a well known legend that deeply engraved our hearts, and she did it very successfully with groups of students aged between 5 years to 20 years. Even someone who doesn't know this story can still follow and understand the concept, because of the way she presented that concept step by step through our traditional dancing. Rasika and her students performed it significantly.

I should say something about the costumes they used for the dances. They designed them very well to match with the particular dance item as well as to match with the particular era. And my self personally, i could see all of our Sri-Lankan traditional dancing systems in the concert. We have three main schools i.e Udarata, Pahatharata and Saparagamuwa. I saw a bit of a nice mix up from the above three segments.
The key roles like Wijaya and Kuveni were very professional, and some scenes like when Wijaya exiled Kuveni with her son and daughter were very emotional. as previous years Rasika has shown again her talent and teaching skills. I am sure most of her students were born and grown in Australia. But she trained them as real professional artists.

Also the supportive services, like the audio visuals used for the dances were very good. Rasika has gained good support from audio visual technicians and other technical team members. As a traditional dancing concert performed outside Sri-Lanka or in a country which is out of that culture, this is a very good and challenging task, which was managed well. Whilst wishing you all the best Rasika and students, I am looking forward for another successful concert in the future.
Well done Visherranga Academy for Traditional Sri-Lankan Dancing.

Sunil Jayawardane
Endeavour Hills